රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
**Department of Government Information**

**2024-08-26 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල**
**රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. සංවර්ධන ප්‍රතිපත්ති මූල්‍යකරණ වැඩසටහනේ දෙවන අදියර සඳහා මූල්‍ය ගිවිසුම අත්සන් කිරීම**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පුළුල් අරමුදල් පහසුකමට සමගාමීව සංවර්ධන ප්‍රතිපත්ති මූල්‍යකරණ වැඩසටහන මඟින් ලෝක බැංකුව ශ්‍රී ලංකාවේ විස්තීරණ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය සඳහා සහාය දක්වනු ලබයි. එම වැඩසටහන ද්වි වාර්ෂික වැඩසටහනක් වන අතර, එහි පළමු අදියර 2023 වර්ෂයේදී සාර්ථකව නිම කරනු ලැබ ඇත. සංවර්ධන ප්‍රතිපත්ති මූල්‍යකරණ වැඩසටහනේ දෙවන අදියර යටතේ රජයේ ප්‍රතිසංස්කරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා විශේෂ හැර ගැනුම් හිමිකම් මිලියන 150.6ක (ඇමෙරිකානු ඩොලර් මිලියන 200කට සමාන) මුදලක් ලබා දීමට ලෝක බැංකුව විසින් එකඟතාව පළ කර තිබේ. ඒ අනුව, එකී මූල්‍ය පහසුකම ලබා ගැනීමට අදාළව ලෝක බැංකු සමූහයේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය සමඟ අදාළ ගිවිසුමට එළඹීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. කෘත්‍රිම බුද්ධිය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික උපාය මාර්ගය**

ශ්‍රී ලංකාව දැනටමත් සිය ඩිජිටල් පරිවර්තන ගමන් මගෙහි සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන ඇති නමුත්, ගෝලීය කෘත්‍රිම බුද්ධිය කෙරෙහි සැලකිය යුතු තරමේ බලපෑමක් ඇති කිරීමට හැකි වී නොමැත. කෘෂිකර්මාන්තය, සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනය වැනි ප්‍රධාන ක්ෂේත්‍රයන් සඳහා කෘත්‍රිම බුද්ධිය යොදා ගැනීමෙන් ඵලදායිතාව ඉහළ නැංවීමටත්, රාජ්‍ය සේවාවන් වැඩිදියුණු කිරීමටත් හැකියාව පවතී. එමඟින්, තිරසර ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීම සහ දරිද්‍රතාව තුරන් කිරීම සඳහා ප්‍රබල දායකත්වයක් සලසන අතර, කෘත්‍රිම බුද්ධියෙහි ප්‍රතිලාභ සමාජය පුරා සාධාරණව බෙදා හැරීමට අවස්ථාව සැලසෙනු ඇත. කෘත්‍රිම බුද්ධිය සංවර්ධනය සහ භාවිතය තුළින් ඩිජිටල් වශයෙන් සවිබල ගැන්වූ ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීමේ අරමුණින් කෘත්‍රිම බුද්ධිය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික උපායමාර්ගය සකස් කරනු ලැබ තිබේ. ඒ අනුව, 2030 වර්ෂය වන විට ශ්‍රී ලංකාව කෘත්‍රිම බුද්ධිය පිළිබඳ කලාපීය

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථානගත කිරීම සහ ගෝලීය තරගකාරිත්වය සහ ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම අපේක්ෂා කරනු ලබයි. එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සකස් කරනු ලැබ ඇති කෘත්‍රිම බුද්ධිය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම පිණිස තාක්ෂණ අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**03. වෝටර් ෆ්‍රන්ට් ප්‍රොපටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහාධිපත්‍යයන්හි පදිංචි නිවාස ගැනුම්කරුවන්ගේ පරවශතා සහ සේවා අයිතිවාසිකම් වෙනුවෙන් බිම් කොටසක් පවරා දීම**

සුඛෝපභෝගී සහාධිපත්‍ය ස්වභාවයේ නිවාස සංවර්ධනය ඇතුළු සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් සමාගම වෙත හෝ එහි නාමිකයා වෙත අවුරුදු 99ක කාලසීමාවක් සඳහා අක්කර 3.03ක ඉඩම් කොටසක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දීර්ඝකාලීන බදු පදනම මත ලබා දී ඇත. ඒ අනුව, අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් සමාගමේ නාමිකයා වන වෝටර් ෆ්‍රන්ට් ප්‍රොපටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර ගිවිසුමකට එළඹ තිබේ. මේ වන විට ව්‍යාපෘතිය යටතේ ඉදි කිරීමට අපේක්ෂිත කුලුනු 06න් සහාධිපත්‍ය නිවාස/මහල් නිවාස ඒකක 425ක් ඇතුළත්ව කුලුනු 03ක් සම්පූර්ණ කර වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇති අතර, ඉතිරි කුලුනු 03හි ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. සහාධිපත්‍ය දේපළට අයත් ඉඩම් කොටසට පරිබාහිරව පවතින බද්දට දෙනු ලැබූ ඉඩමට ඇතුළත් වන පර්චස් 60.5ක ඉඩම් ප්‍රමාණයක් එම නිවාස ගැනුම්කරුවන්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් වන සේවා සඳහා භාවිත කර ඇත. එකී ඉඩම් කොටස ඇතැම් පොදු පහසුකම් සැපයීමේ සේවා මාර්ග සහ රූපවාහිනී, දුරකථන/විදුලි සංදේශ සේවා, මාර්ග අයිතිවාසිකම් වැනි ඉදි කිරීම පිණිස භාවිත කර ඇත. එබැවින්, එකී ඉඩම් කොටස හරහා වැටී ඇති පරවශතා සහ සේවා අයිතිවාසිකම් වෝටර් ෆ්‍රන්ට් ප්‍රොපටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සහාධිපත්‍ය පදිංචි නිවාස ගැනුම්කරුවන්ගේ ප්‍රයෝජනය සඳහා පැවරීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**04. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්, අපනයනකරුවන් බවට පත් කිරීම පිණිස අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය සහ ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව අතර සහයෝගිතා ගිවිසුම**

අපනයන විභවයක් සහිත කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් අපනයනකරුවන් බවට පත් කිරීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලයේ නව අපනයනකරුවන් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ පහසුකම් සැලසීම පිණිස ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව සහ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය අතර සහයෝගිතා ගිවිසුමකට අත්සන් තැබීමට යෝජනා වී ඇත. එකී සහයෝගිතා ගිවිසුම සඳහා නීතිපතිගේ නිෂ්කාශනය සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශ ලැබී තිබේ. ඒ අනුව, යෝජිත සහයෝගිතා ගිවිසුම දෙපාර්ශ්වය අතර අත්සන් තැබීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් පොලොන්නරුව ගොවිපොළෙහි ඉඩම් කොටසක් ජෙෆ්රි බාවා පදනම වෙත ලබා දීම**

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් පොලොන්නරුව ගොවිපොළෙහි කළමනාකාර නිල නිවස ශ්‍රී ලංකාවේ සුප්‍රකට වාස්තු නිර්මාණ ශිල්පියෙකු වන දේශමාන්‍ය ජෙෆ්රි බාවා මහතා විසින් නිර්මාණය කරනු ලැබ ඇත. එකී නිල නිවස සහ එය පිහිටි අක්කර 05ක පමණ ඉඩම් කොටසක් බදු පදනම මත ලබා දෙන ලෙස ජෙෆ්රි බාවා පදනම විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, පොලොන්නරුව ගොවිපොළෙහි කළමනාකාර නිල නිවස සහ එම නිල නිවස පිහිටි අක්කර 05ක ඉඩම් කොටසක් බදු පදනම මත ජෙෆ්රි බාවා පදනම වෙත ලබා දීම පිණිස කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. වී අලෙවි මණ්ඩලය මඟින් වී මිල දී ගැනීම - 2024 යල**

2024 යල කන්නයේ වී අස්වනු නෙළීම මේ වන ආරම්භ කර ඇති අතර, යල කන්නයේ වී මිල දී ගැනීම සඳහා සහනදායි පොලී අනුපාතයක් මත වාණිජ බැංකු හරහා රුපියල් මිලියන 6,000ක උපරිමයක් දක්වා සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට ඔඩපණ ණය ලබා දීම පිණිස දැනටමත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. වී මිල දී ගැනීමේ තරගකාරිත්වය ඉහළ නැංවීමේ සහ එළඹෙන මහ කන්නයේ වී නිෂ්පාදනය දිරිගැන්වීමේ අරමුණින් ගරු ජනාධිපතිතුමා සහ කෘෂිකර්ම

සහ වැවිලි කර්මාන්ත ඇමතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනා සැලකිල්ලට ගනිමින් පහත සඳහන් පරිදි කටයුතු කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී:

* 2024 යල කන්නයේ රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන සඳහා සක්‍රියව සහභාගී වීමට හැකි වන පරිදි වී අලෙවි මණ්ඩලය වෙත රුපියල් මිලියන 500ක ප්‍රතිපාදන සලසා දීම.

* වී අලෙවි මණ්ඩලය මගින් නාඩු වී කිලෝග්‍රෑම් එකක් රුපියල් 105/- බැගින් ද, සම්බා වී කිලෝග්‍රෑම් එකක් රුපියල් 115/- බැගින් ද, කීරි සම්බා වී කිලෝග්‍රෑම් එකක් රුපියල් 130/- බැගින් ද මිල දී ගැනීම.

* එළඹෙන මහ කන්නයේදී උපරිම වී අස්වැන්නක් ලබා ගැනීමට හැකි වන පරිදි වී වගාව සඳහා ගොවීන් දිරිගැන්වීම පිණිස දැනට හෙක්ටයාර එකක් සඳහා ගෙවනු ලබන රුපියල් 15,000/-ක් වන පොහොර සහනාධාරය හෙක්ටයාර එකක් සඳහා රුපියල් 25,000/- දක්වා වැඩි කිරීම.

## 07. එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම

පහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළව අන්‍යොන්‍ය ප්‍රතිලාභ සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය සහයෝගිතා රාමුවක් ස්ථාපිත කිරීම අරමුණු කර ගනිමින් වසර 03ක කාලයක් සඳහා එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම පිණිස විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* තිරසර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පුහුණු සහ ඉගෙනුම් සහාය.

* සම්මන්ත්‍රණ, රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ බහුපාර්ශ්වික සාකච්ඡා, සන්නිවේදනයේ කුසලතා සංවර්ධනය, මැදිහත්වීම සහ නායකත්වය, අන්තර්ගතය පදනම් කරගත් වැඩමුළු සහ දේශගුණික විපර්යාස හා මානව හිමිකම් පිළිබඳ විශේෂිත පාඨමාලා වැනි ක්ෂේත්‍රයන් සඳහා රාජ්‍යතාන්ත්‍රිකයින් පුහුණු කිරීම.

* ආපදා අවදානම් අවම කිරීම සහ අර්බුද කළමනාකරණය සඳහා භූ-තොරතුරු තාක්ෂණය (GIS) භාවිතය පිළිබඳ එක්සත් ජාතීන්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනයේ මෙහෙයුම් චන්ද්‍රිකා යෙදුම් වැඩසටහන (UNOSAT) මඟින් පුහුණු කිරීම් සිදු කිරීම.

**08. 2024 ජනාධිපතිවරණය නිරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන යුරෝපා සංගමයේ නියෝජිත පිරිස සහ විදේශ කටයුතු අමාත්‍යාංශය අතර පරිපාලන විධිවිධාන**

2024 ජනාධිපතිවරණය නිරීක්ෂණය කිරීම සඳහා මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමක් මෙරටට එවන ලෙස මැතිවරණ කොමිසමේ සභාපති විසින් යුරෝපා සංගමයට ආරාධනා කර ඇත. එකී සංගමයේ රෙගුලාසි යටතේ මැතිවරණ නිරීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට පෙර ශ්‍රී ලංකාවට පැමිණෙන යුරෝපා සංගමයේ නියෝජිත පිරිස සහ විදේශ කටයුතු අමාත්‍යාංශය අතර පරිපාලන විධිවිධාන අත්සන් කළ යුතුව තිබේ. ඒ අනුව, දෙපාර්ශ්වය අතර 2024-08-05 දින 2024 ජනාධිපතිවරණය නිරීක්ෂණය කිරීම සම්බන්ධයෙන් වන පරිපාලන විධිවිධානයන්ට අත්සන් තබා ඇති අතර, ඒ සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ තොරතුරු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

**09. 2025 වර්ෂයේදී නොමිලේ බෙදා හැරීමට අවශ්‍ය පාසල් පෙළපොත් මුද්‍රණය කිරීම**

2025 වර්ෂය සඳහා මුද්‍රණය කිරීමට නියමිත පෙළපොත් වර්ග 317න් පෙළපොත් වර්ග 71ක් රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවෙන් මුද්‍රණය කරවා ගැනීමට 2024-04-01 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. 2025 වර්ෂයේදී පාසල් දරුවන් වෙත නොමිලේ බෙදා හැරීමට අවශ්‍ය ඉතිරි පාසල් පෙළපොත් වර්ග 246 මුද්‍රණය කරවා ගැනීම සඳහා ජාතික තරගකාරී ලංසු කැඳවා තිබේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ පරිදි සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම මිල ගණන් ඉදිරිපත් කරනු ලැබ ඇති මුද්‍රණ ආයතන 24ක් වෙතින් 1, 6 සහ 10 ශ්‍රේණි හැර අනෙකුත් ශ්‍රේණිවල පෙළපොත් මුද්‍රණය කරවා ගැනීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**10. කින්නියා-කුරිංචාකේණි මාර්ගයේ කුරිංචාකේණි පාලම ප්‍රතිනිර්මාණය කිරීම**

සංවර්ධනය සඳහා වන සෞදි අරමුදලෙන් අරමුදල් සැපයෙන මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ බදුල්ල-චෙංකලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ඉතිරි අරමුදල් මඟින් කින්නියා-කුරිංචාකේණි මාර්ගයේ කුරිංචාකේණි පාලම ප්‍රතිනිර්මාණය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා තනි අදියරේ තනි ලිපි කවර ක්‍රමය යටතේ ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 09ක් ලැබී තිබේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ පරිදි සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන ඊ.එල්.එස්. කන්ස්ට්‍රක්ෂන් (පෞද්ගලික) සමාගම වෙත එකී කොන්ත්‍රාත්තුව පිරිනැමීම පිණිස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**11. 2024 අංක 03 දරන කොළඹ වරාය නගරය (සහාධිපත්‍ය දේපළ කළමනාකරණය) නියෝග**

කොළඹ වරාය නගරයේ ප්‍රධාන සැලැස්මට අනුව දළ බිම් ප්‍රමාණයෙන් 51%ක් නේවාසික පරිහරණය සඳහා වෙන් කර ඇති අතර, එමඟින් සහාධිපත්‍ය දේපළ සංවර්ධනය සඳහා මග සලසනු ලබයි. ඒ අනුව, සහාධිපත්‍ය කොටස්වල හිමිකරුවන්ට සහ කුලී නිවැසියන්ට බාධාවකින් තොරව ජීවත්වීමේ අවකාශ සලසා දෙමින් ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් පොදු පහසුකම් සහ අංගෝපාංග පවත්වා ගෙන යාමට නියාමන ආයතනයක් ස්ථාපිත කිරීම සහ නියෝග පැනවීම අවශ්‍ය වී ඇත. 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනතේ විධිවිධාන පරිදි අංක 2394/68 හා 2024-07-26 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් 2024 අංක 03 දරන කොළඹ වරාය නගරය (සහාධිපත්‍ය දේපළ කළමනාකරණය) නියෝග ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ. එකී නියෝග අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**12. ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනතාවගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් නව නීතියක් හඳුන්වා දීම**

ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනතාවගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් නව නීතියක් හඳුන්වා දීම සම්බන්ධයෙන් එවකට අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ඇමතිතුමා සහ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු ඇමතිතුමා ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ යෝජනාව 2024-05-22 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට ගන්නා ලදී. එහිදී අදාළ සියලුම පාර්ශ්වයන්ගේ සහභාගිත්වයෙන් පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ සංකල්ප පත්‍රිකාව තවදුරටත් විශ්ලේෂණය කිරීම යෝග්‍ය බවට තීරණය කරනු ලැබ ඇත. ඒ අනුව, ඉඩම්, වනජීවී හා වන සංරක්ෂණ, පරිසර සහ මුදල් යන විෂයයන් පැවරී ඇති අමාත්‍යාංශවල නිලධාරීන්, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මෙන්ම අදාළ ක්ෂේත්‍රය පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් සහ අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා වට කිහිපයක් පවත්වා අදාළ මූලික කෙටුම්පත තවදුරටත් වැඩිදියුණු කර ඇත. එකී මූලික කෙටුම්පත මත පදනම්ව පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**13. සමෘද්ධි සංවර්ධන අධිකාරියට අනුයුක්තව සේවය කළ සේවකයින්හට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අන්තර්ග්‍රහණය වීම සඳහා අවස්ථාව සලසා දීම**

2013 අංක 01 දරන දිවිනැගුම පනත හරහා දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමේදී එවකට සමෘද්ධි සංවර්ධන අධිකාරියට අනුයුක්තව සේවය කරන ලද සේවකයින්හට එම පනතේ ප්‍රතිපාදන යටතේ තම මනාපය පරිදි විශ්‍රාම වැටුපක් සහිතව එවකට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අන්තර්ග්‍රහණය වීමට අවස්ථා කිහිපයකදී අවස්ථාව සලසා දී තිබුණි. එහෙත් විවිධ කරුණු හේතුවෙන් තම මනාපය සංශෝධනය කිරීමට නොහැකි වූ සේවකයින් 3,000ක් පමණ සිටින බව හඳුනාගෙන තිබේ. ඒ අනුව, පවතින නීතිමය රාමුව තුළ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසමින් සමෘද්ධි සංවර්ධන

දෙපාර්තමේන්තුව වෙත අන්තර්ග්‍රහණය වීමට එකී සේවක පිරිසට අවස්ථාව සලසා දීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව ලබා දෙන ලදී.

14. **යෝජිත නිපුණතා සංවර්ධන වැඩසටහන 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම**

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද අධීක්ෂණ කමිටුව විසින් ප්‍රමුඛතා පදනම මත ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කර ඇත:

(i) ශිෂ්‍ය-පාදක අරමුදල් යෝජනා ක්‍රමයක් යටතේ 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පද්ධතින් හරහා වර්ෂයකට 50,000 බැගින් රැකියාභිමුඛ පුහුණු ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

(ii) ද්විතීයික අධ්‍යාපනයේ නිරත සිසුන් ඉලක්ක කර ගත් වෘත්තීය පුහුණු පාඨමාලා අවස්ථා වර්ෂයකට 60,000 බැගින් ප්‍රදානය කිරීම.

ඒ අනුව, එකී යෝජනා ක්‍රියාත්මක කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය දැනටමත් රජය සහ ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී ක්‍රියාත්මක කිරීමට යෝජිත රුපියල් මිලියන 100ක මූල්‍ය ආයෝජනය මඟින් සලසා ගැනීමට හැකි වන පරිදි මහා භාණ්ඩාගාරය විසින් 2025 වර්ෂයේ සිට ඉදිරි වසර 05ක කාලයක් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමටත්, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද අධීක්ෂණ කමිටුව සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එක්ව එකී වැඩසටහන ක්‍රියාත්මක කිරීමටත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද අධීක්ෂණ කමිටුවේ සභාපති වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**************